# ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

## කාර්ය මණ්ඩල පුරප්පාඩු

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය CAASL විසින්, ජාතික නෛතික අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPs) හට අනුකූල වන ආරක්ෂිත, ප්‍රවේශම් සහිත, කාර්යක්ෂම හා පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක්, මනාලෙස ස්ථාපිත නියාමන කාර්ය රාමුවක් යටතේ උපායමාර්ගික සැලසුම්කරණය, වෘත්තීය මාර්ගෝපදේශ හා දැඩි ආවේක්ෂණය තුළින් සහතික කරනු ලබයි. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පහත සඳහන් තනතුරු පිරවීම සඳහා කාර්යක්ෂම, උද්යෝගිමත් හා ස්වයං අභිප්‍රේරිත සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි ඉතා ඉහළ සුදුසුකම් හා දීර්ඝ පළපුරුද්ද සහිත අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් සුරක්ෂිතතා රෙගුලාසි)

**තනතුරු කේතය : HM-2-1-DDG2 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM 2-1) - රු. 161,140-12x4,850-219,340/- - MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ)

- සියලූ දීමනා ඇතුළත් මාසික වේතනය, දළ වශයෙන් රු. 252,294.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. ප්‍රවාහන දීමනාව රු. 50,000.00 ක් ඇතුළුව)
- ඉන්ධන දීමනාව, මාසිකව ලීටර් 135 වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- අවශ්‍ය සුදුසුකම් සපුරාලන සාර්ථක අයදුම්කරු සඳහා දළ වශයෙන් රු. 285,000.00 ක විශේෂ තාක්ෂණික දීමනාවක් ගෙවනු ලැබේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

සහ

2. ගුවන් සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters') හෝ ගුවන් සේවාවන්ට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පවත්වනු ලබන සති අටකට (08) නොඅඩු (කළමනාකරණ මට්ටමේ) පිරිස් බලපත්‍ර නිකුත් කිරීම, ගුවන් යානා මෙහෙයුම්, ගුවන් යෝග්‍යතාව සම්බන්ධයෙන් පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පිරිස් බලපත්‍ර නිකුත් කිරීම, ගුවන් යානා මෙහෙයුම් සහ ගුවන් යෝග්‍යතාව ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර දහඅටක (18) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 01**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 02**

1. අධ්‍යක්ෂ (පුහුණු සංවිධාන සහ පිරිස් බලපත්‍ර) අධ්‍යක්ෂ (ගුවන් යානා මෙහෙයුම්) හෝ අධ්‍යක්ෂ (ගුවන් යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව) කෙනෙකු ලෙස අවම වසර පහක (05) සේවා පළපුරුද්ද

සහ

2. පූර්ව වසර පහක නිකැළැල් සේවා වාර්තාවක් සතුවීම හා වර්තමාන තනතුරට හිමි සියලූ වැටුප් වර්ධක ලබා තිබීම,

සහ

3. ICAO විසින් අනුමත, සති හයකට (06) නොඅඩු පිරිස් බලපත්‍ර නිකුත් කිරීම, ගුවන් යානා මෙහෙයුම් හෝ ගුවන් යෝග්‍යතාව ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

සහ

4. වාර්ෂික කාර්ය සාධනය සම්බන්ධයෙන් "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා තිබීම.

සහ

5. බහු විෂයන්ගෙන් සමන්විත කණ්ඩායම් හට මග පෙන්වීමේ සහ දිශානති කිරීමේ සනාථ කළ හැකියාව. මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂම කළමනාකරණයේ සහ නියමානුකූල සංවර්ධනයේ පළපුරුද්ද

### නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ කළමනාකරණ)

**තනතුරු කේතය : HM-2-1-DDG3 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM 2-1) - රු. 161,140-12x4,850-219,340/- - MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ)

- සියලූ දීමනා ඇතුළත් මාසික වේතනය, දළ වශයෙන් රු. 252,294.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. ප්‍රවාහන දීමනාව රු. 50,000.00 ක් ඇතුළුව)
- ඉන්ධන දීමනාව, මාසිකව ලීටර් 135 වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, කළමනාකරණ, වාණිජ්‍ය හෝ පරිපාලන ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

සහ

2. ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, කළමනාකරණ, වාණිජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters') හෝ මූල්‍ය කළමනාකරණ හෝ පරිපාලන ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය.

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකණ තලයේ මූල්‍ය කළමනාකරණ, පරිපාලන හෝ විගණන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහඅටක (18) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

1. CAASL හි අධ්‍යක්ෂ (මානව සම්පත් සහ දේපළ කළමනාකර) අධ්‍යක්ෂ (මූල්‍ය සහ ආදායම් කළමනාකරණ) හෝ අධ්‍යක්ෂ (තත්ත්ව සහ අභ්‍යන්තර විගණන) කෙනෙකු ලෙස අවම වසර පහක (05) සේවා පළපුරුද්ද.

සහ

2. පූර්ව වසර පහක නිකළැල් සේවා වාර්තාවක් සතුවීම සහ වර්තමාන තනතුරට හිමි සියලූ වැටුප් වර්ධක ලබා තිබීම.

සහ

3. වාර්ෂික කාර්ය සාධනය සම්බන්ධයෙන් "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා තිබීම.

සහ

4. බහු විෂයන්ගෙන් සමන්විත කණ්ඩායම් හට මගපෙන්වීම සහ දිශානති කිරීමේ සනාථ කළ හැකියාව, මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂම කළමනාකරණයේ සහ නියමානුකූල සංවර්ධනයේ පළපුරුද්ද.

### අධ්‍යක්ෂ (ගුවන් යානා මෙහෙයුම්)

**තනතුරු කේතය : HM-1-1-D6 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM -1) - රු.140,640-15x4,100-202,140/ - MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ)

- සියලූ දීමනා ඇතුළත් මාසික වේතනය, දළ වශයෙන් රුපියල් 233,699.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. ප්‍රවාහන දීමනාව රු. 50,000.00 ක ඇතුළුව)
- ඉන්ධන දීමනාව, මාසිකව ලීටර් 115 ක් වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- අවශ්‍ය සුදුසුකම් සපුරාලන සාර්ථක අයදුම්කරු සඳහා දළ වශයෙන් රු. 260,000.00 ක විශේෂ තාක්ෂණික දීමනාවක් ගෙවනු ලැබේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 1**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ස්වභාවික විද්‍යාව, ගුවන් ප්‍රවාහනය, ගගනතල හෝ ගුවන් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

සමග

2. ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි (Masters) සුදුසුකමක් හෝ ගුවන් සේවා පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද ගුවන් ගමන් සුරක්ෂිතතාව/ ගුවන් යානා මෙහෙයුම් පිළිබඳ සති හයකට (06) නොඅඩු කාලයක පුහුණු පාඨමාලා (කළමනාකරණ මට්ටම) මාලාවක් සාර්ථකව සම්පූර්ණකර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වාණිජ තියමුවකු හෝ පියසර පිටත් කරන්නකු ලෙස කළමනාකරණ මට්ටමේ අවම වසර දහයක (10) පළපුරුද්ද.

**විකල්ප - 2**

1. ගුවන්සේවා සම්බන්ධ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද සුරක්ෂිතතා පරීක්ෂණ/ ගුවන් යානා මෙහෙයුම් ඇතුළත්, සති හයකට (06) නොඅඩු ගුවන්යානා මෙහෙයුම් පුහුණු පාඨමාලාවක් (කළමනාකරණ මට්ටමේ) සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

සහ

2. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වාණිජ ගුවන් නියමුවකු හෝ පියාසර පිටත්කරන්නෙකු ලෙස අවම වසර විස්සක (20) සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම

**විකල්ප - 2**

1. ගුවන් යානා මෙහෙයුම් ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

සහ

2. පසුගිය වසර පහක (05) තුළ නිකැළැල් සේවා වාර්තාවක් සතුවීම සහ වර්තමාන තනතුරට හිමි සියලූම වැටුප් වර්ධක ලබා තිබීම.

සහ

3. අධිකාරිය විසින් අනුමත, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ එහි පිළිගත් ආයතනයක් විසින් පවත්වන ලද සුරක්ෂිතතා පරීක්ෂක මෙහෙයුම් පාඨමාලාව ඇතුළත් ගුවන්යානා පියාසර මෙහෙයුම් සහ ගුවන් සේවා බිම් මෙහෙයුම් ක්ෂේත්‍රයේ සති හයකට (06) නොඅඩු උසස් පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

සහ

4. පසුගිය වසර පහ (05) සඳහා වාර්ෂික කාර්ය සාධනයේ ඇගයුම් සඳහා "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

### අධ්‍යක්ෂ (ගුවන් යානා ආරක්ෂණ)

**තනතුරු කේතය : HM-1-1-D1 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM 1-1) - රු.140,640-15x4,100-202,140/ - MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ)

- සියලූ දීමනා ඇතුළත් මාසික වේතනය, දළ වශයෙන් රුපියල් 233,699.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. ප්‍රවාහන දීමනාව රු. 50,000.00 ක ඇතුළුව)
- ඉන්ධන දීමනාව, මාසිකව ලීටර් 115 ක් වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- අවශ්‍ය සුදුසුකම් සපුරාලන සාර්ථක අයදුම්කරු සඳහා දළ වශයෙන් රු. 185,000.00 ක විශේෂ තාක්ෂණික දීමනාවක් ගෙවනු ලැබේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 1**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

සමග

2. ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි (Masters) සුදුසුකමක් හෝ ගුවන් සේවා පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද සති හයකට (06) නොඅඩු පාඨමාලාවක් (කළමනකරණ මට්ටමේ) සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ගුවන් ආරක්ෂණ ක්‍ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වසර දහයක (10) පළපුරුද්ද.

**විකල්ප - 2**

1. ගුවන්සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Master') සුදුසුකමක් හෝ ගුවන් සේවා පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ ජාත්‍යන්තරව සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද සති හයකට (06) නොඅඩු පාඨමාලාක් (කළමනාකරණ මට්ටමේ) සාර්ථකව සම්පූර්ණ තර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

සහ

2. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික සේවා ආයතනයක ගුවන් ආරක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වසර දහතුනක (13) සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම

**විකල්ප - 2**

1. ගුවන් සේවා ආරක්ෂණ හෝ ගුවන් තොටුපොළ ආරක්ෂණ ක්ෂේත්‍රයෙහි කළමනාකරු වර්ගීකරණයේ (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.
2. පූර්ව වසර පහක (05) නිකැළැල් සේවා වර්තාවක් තිබීම සහ වර්තමාන තනතුරට හිමි සියලූම වැටුප් වර්ධක ලබා තිබීම.
3. අධිකාරිය විසින් අනුමත, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ එහි පිළිගත් ආයතනයක් විසින් පවත්වන ලද ගුවන් ආරක්ෂණ ක්ෂේත්‍රයේ සති හයකට (06) නොඅඩු උසස් පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම
4. පසුගිය වසර පහ (05) සඳහා වාර්ෂික කාර්ය සාධනයේ ඇගයුම් සඳහා "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

### අධ්‍යක්ෂ (තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ)

**තනතුරු කේතය : HM-1-1-D12 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM -1) - 140,640-15x4,100-202,140/ - MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ)

- සියලූ දීමනා ඇතුළත් මාසික වේතනය දළ වශයෙන් රු. 233,699.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව ඇතුළුව)
- ඉන්ධන දීමනාව, මාසිකව ලීටර් 115 වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයෙහි ප්‍රථම උපාධියක්.

සහ

2. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Masters') සුදුසුකමක්

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වසර දහතුනක (13) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 01**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 02**

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ හි කළමනාකරු වර්ගීකරණයේ (MM1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### අධ්‍යක්ෂ (පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති)

**තනතුරු කේතය : HM-1-1-D4 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM 1-1) - 140,640-15x4,100-202,140/ - MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ)

- සියලූ දීමනා ඇතුළත් මාසික වේතනය, දළ වශයෙන් රුපියල් 233,699.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. ප්‍රවාහන දීමනාව රු. 50,000.00 ක ඇතුළුව)
- ඉන්ධන දීමනාව, මාසිකව ලීටර් 115 ක වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 01**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පර්යේෂණ, සංවර්ධන සැලසුම්, විද්‍යාව, කළමනාකරණය, වාණිජ්‍ය හෝ කලා ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්. කෙසේ වුවද පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවනු ඇත.

සහ

2. පශ්චාත් උපාධි (Masters') සුදුසුකමක් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ තලයේ පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්‍ෂේත්‍රයේ අවම වසර දහයක (10) සේවා පළපුරුද්ද

**විකල්ප - 02**

1. පශ්චාත් උපාධි සුදුසුකමක් (පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ (Masters' උපාධිය) හෝ පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් සඳහා පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

සහ

2. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ තලයේ, පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ අවම වසර දහතුනක (13) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 01**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 02**

1. පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්‍ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM 1-1) සහ ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

2. පූර්ව වසර පහක නිකළැල් සේවා වාර්තාවක් හිමිවීම සහ වර්තමාන තනතුරට හිමි සියලූම වැටුප් වර්ධක ලබාගෙන තිබීම.

සහ

3. පසුගිය වසර පහ සඳහා වාර්ෂික කාර්යසාධන ඇගයුම් සඳහා "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

